# රත්නපුර දිස්ත්‍රික්කයේ ගල් ගුහා ආශ්‍රිත සංචාරණ ප්‍රවර්ධනය

එම්. හිමාෂි ලක්මාලි පතිරණ*

ගල් ගුහා සංචාරණය සංචාරක කර්මාන්තයෙහි ජනප්‍රිය අංගයකි. සබරගමුව පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයෙහි පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා ජෛව විවිධත්වයෙන් අනූන ගල්ලෙන් විශාල ප්‍රමාණයක් පිහිටා තිබුණ ද ඒවා දෙස් විදෙස් සංචාරක ඇසින් දුරස්ව පවතී. එම ගල් ගුහා සංචාරක කර්මාන්තය සඳහා ප්‍රවර්ධනය කරන්නේ කෙසේද? යන්න මෙම අධ්‍යයනය මගින් සිදු කරනු ලැබීය. ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කයෙහි බටදොඹලෙන, කුරගල තපෝවන ආරණ්‍ය සේනාසනය, බුදුගල පධානඝර ආරණ්‍ය සේනාසනය, සංඛපාල ගල්ලෙන් රජමහ විහාරය හා වවුල්පනේ හිරිගල් ගුහාව ආදී ගල්ලෙන් පහක් පිළිබඳව මෙහිදී අවධානය යොමුකර තිබේ. මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන ගල් ගුහා සඳහා පැමිණෙන සංචාරකයින් පිරිස වැඩිකිරීම සහ එම ගල් ගුහා ප්‍රවර්ධනය කිරීමට ප්‍රවර්ධන වැඩපිළිවෙලක් යෝජනා කිරීමයි. අධ්‍යයනය සඳහා දත්ත එකතු කිරීමට ප්‍රාථමික දත්තයන් වශයෙන් ගල්ගුහා පිහිටා තිබෙන ප්‍රදේශවල ගම්වැසියන් එක් ගමකින් දහය බැගින් තෝරාගෙන මිනිසුන් පනස් දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා යොදාගන්නා ලදී. තවද සංචාරකයින් සිය දෙනෙක සඳහා ප්‍රශ්නාවලියක් ලබා දීම සහ නිරීක්ෂණ ක්‍රමයද උපයෝගී කොට ගැනුණි. එසේම ග්‍රන්ථ, සඟරා පරිශීලනය, අන්තර්ජාලය භාවිතය හා මේ පිළිබඳව සිදුකර ඇති වෙනත් පර්යේෂණ, පුවත්පත් ආදිය ද ද්විතීයික දත්තයන් ලෙස උපයෝගී කරගනු ලැබීය.

සංචාරක කර්මාන්තය ලොව ජනප්‍රියම කර්මාන්තය බවට පත්ව තිබුණ ද ගල් ගුහා සංචරණයට යොමුවන පිරිස ඉතා සීමිත වනුයේ මෙම ගල්ලෙන් පිළිබඳව ඔවුන් තුළ පවතින නොදැනුවත්කම සහ මීට වඩා සංචාරක ආකර්ෂණයකින් යුතු ස්ථාන ශ්‍රී ලංකාව තුළ පිහිටා තිබීමත් එම ගල්ලෙන් ආශ්‍රිතව දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමත් බව මෙම අධ්‍යයනය මගින් තහවුරු විය. එබැවින් ගල්ලෙන්, සංචාරක කර්මාන්තයට ප්‍රවර්ධනය කිරීමට නම් ඒ පිළිබඳව සංචාරකයා දැනුවත් කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. එහිදී අත් පත්‍රිකා නිර්මාණය, මාර්ගෝපදේශකයින් රැඳවීම හා යටිතල පහසුකම් ප්‍රවර්ධනය ආදිය සිදු කිරීමට යෝජනා කළ හැකිය. රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා ජෛව විවිධත්වයෙන් අනූන මෙම ගල්ලෙන් ආරක්ෂා කර ගනිමින් සංචාරක කර්මාන්තයට ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට වැඩි විදේශ විනිමයක් උපයාගත හැකිය.

ප්‍රමුඛ පද - ගල් ලෙන්, ප්‍රවර්ධනය, සංචාරක කර්මාන්තය, රත්නපුර දිස්ත්‍රික්කය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය himashilakmali91@gmail.com